ආයතනයේ නම: ආරක්ෂක අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

நிறுவனத்தின் பெயர்: பாதுகாப்பு அமைச்சு

பாராளுமன்றத்தின் அரச கணக்கு குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்பட்டு நடவடிக்கைகளும் பாராளுமன்றத்தில் சமர்ப்பித்தல்.

Name of the Institution: Ministry of Defence

Submission of Observations of Hon. Minister and Steps Taken with Regard to the Reports Tabled by the Committee on Public Accounts in Terms of Standing Order No:119(4)

පටුන/பக்கம்/Contents

භාෂාව/மொழி/Language	පිටු අංකය/பக்க இலக்கம்/ Page Number
සිංහල/சிங்களம்/Sinhala	1-43
දෙමළ/தமிழ்/Tamil	44-87
ඉංග්‍රීසි/ஆங்கிலம்/English	88-127

පටුන

අනු අංකය	ආයතනයේ / දෙපාර්තමේන්තුවේ නම	පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 116 හි අදාළ නිරීක්ෂණ දැක්වෙන පිටු අංක	ආයතන / දෙපාර්තමේන්තු වලට අදාළ නිරීක්ෂණ හා ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග ඇතුලත් පිටු අංක
1	ආරක්ෂක අමාත්‍යාංශය	66	1-7
2	ආපදා කළමනාකරණ අමාත්‍යාංශය	74	8-9
3	නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය	73-74	10-12
4	ශ්‍රී ලංකා යුද්ධ හමුදාව	113	13-16
5	ශ්‍රී ලංකා නාවික හමුදාව	125-126	17-20
6	ශ්‍රී ලංකා ගුවන් හමුදාව	137-138	21-22
7	සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව	137	23-24
8	ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව	107-108	25-30
9	ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව	110-111	31-35
10	පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව	135	36-38
11	කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව	90	39-43

<u>රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 116 මඟින් පෙන්වාදී ඇති දුර්වලතාවයන් සමථයකට පත්කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග/වර්තමාන තත්ත්වය.</u>

1. ආරක්ෂක අමාත්‍යාංශය

කම්ටුව විසින් හඳුනාගනු ලැබූ දුර්වලතා	දුර්වලතාවයන් සමථයකට පත් කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්ථමාන තත්ත්වය
01. හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	අ. ආරක්ෂක අමාත්‍යාංශයට අයත් හානි පිළිබඳ ලේඛනය යටතේ ත්‍රිවිධ හමුදා මූලස්ථානයට අදාළ වන හානි ද ඇතුලත් කර අදාළ ලේඛනය පවත්වාගෙන යනු ලැබේ.
02. විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	අ. විගණකාධිපති විසින් ඉදිරිපත් කර ඇති විගණන විමසුම් වලට පිළිතුරු යැවීමේදී 2018 වර්ෂයේදී යම් ප්‍රමාදයන් තිබුණද, මේ වන විට එවැනි ප්‍රමාදයන් ඇති නොවන අයුරින් කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. එසේ වුවද ඇතැම් විගණන විමසුම් සඳහා මෙම අමාත්‍යාංශයට අයත් එක් එක් අංශ සහ ආයතන/දෙපාර්තමේන්තු වෙතින් පිළිතුරු ගෙන්වා ගැනීමෙන් පසු පිළිතුරු ලබා දීමට සිදුවීම මත ඇතම් විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ලබාදීම ප්‍රායෝගිකව අපහසු වී ඇත. ආ. එසේම පිළිතුරු ලබාදිය යුතු සියලුම විගණන විමසුම් සඳහා අපේක්ෂිත කාලසීමාවන් තුළදී පිළිතුරු ලබාදෙන ලෙසටත් එවැනි නිරීක්ෂණ නැවත ඇති නොවන පරිදි කටයුතු කරන ලෙසටත් මෙම අමාත්‍යාංශයට අයත් සියලුම අංශ සහ ආයතන/දෙපාර්තමේන්තු වල අදාළ නිලධාරීන් සහ කාර්යය මණ්ඩලය දැනුවත් කර ඇත.
03. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	අ. අභ්‍යන්තර විගණන විමසුම් වලට පිළිතුරු යැවීමේදී 2018 වර්ෂයේදී යම් යම් ප්‍රමාදයන් තිබුණද, මේ වන විට එවැනි ප්‍රමාදයන් ඇති නොවන අයුරින් කටයුතු කර ඇත.

	ආ. එසේ පිළිතුරු ලබා දියයුතු සියලුම අභ්‍යන්තර විගණන විමසුම් සඳහා අපේක්ෂිත කාල සීමාවන් තුළදී පිළිතුරු ලබාදෙන ලෙසටත් එවැනි නිරීක්ෂණ නැවත ඇති නොවන පරිදි කටයුතු කරන ලෙසටත් මෙම අමාත්‍යාංශයට අයත් සියලුම අංශවල නිලධාරීන් සහ කාර්යය මණ්ඩලය දැනුවත් කරීමට කටයුතු කර ඇත.
04. 2016.03.31 දිනැති අංක 5/2016 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අ. 2018.12.31 දිනට අවසන් වර්ෂය සඳහා ආරක්ෂක අමාත්‍යාංශය ඇතුළු අනෙකුත් ආයතන 16 ක භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා 2018.12.05 වන දින මණ්ඩල පත් කරන ලදී. ඒ අනුව අදාළ සමීක්ෂණ වාර්තා 2019.03.31 දිනට පෙර විගණකාධිපති වෙත වාර්තා කලයුතු හෙයින් 2019.01.25 දිනට පෙර ලබාදීමට කටයුතු කරන ලෙස දන්වන ලදී. ඒ අනුව 2019.03.31 දින වනවිට විගණකාධිපති වෙත ආයතන 06 ක (ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලය, ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය, ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය, රාජ්‍ය බුද්ධි සේවාව, පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, ඒකාබද්ධ සේවා භාෂා පුහුණු ආයතනය) වාර්තා ඉදිරිපත් කිරීමට හැකිවිය. ඉන්පසුව 2019.04.21 දින ඇති වූ හදිසි බෝම්බ ප්‍රහාරය හේතුවෙන් රටේ පැවති අනාරක්ෂිත තත්ත්වය මත සමීක්ෂණ මණ්ඩල නිලධාරීන් හට භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා සහභාගී වීමට දුෂ්කර තත්ත්වයක් පැවතුන අතර, එම අනාරක්ෂිත තත්ත්වය පහව ගිය පසු අනෙකුත් සියලුම ආයතන වල භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කරන ලදී. ඒ අනුව 2019.12.20 වන දින වනවිට ආරක්ෂක අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින සියලුම ආයතනවල භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත යොමුකර ඇත.
05. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුල ක්‍රියාත්මක කර නොතිබුනි.	අ. 2018.12.31 දිනට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවතින අනෙකුත් ආයතනවල අතිරික්ත, ඌනතා පවතින බවට මණ්ඩල විසින් අනාවරණය කර නොතිබුනි. ආරක්ෂක අමාත්‍යාංශයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති

	වෙත යොමු කරන ලද්දේ 2019.12.20 වන දින වේ. මන්ද රටේ පැවති අනාරක්ෂිත තත්ත්වය මත නිලධාරීන් බොහෝ කාර්යබහුල වීමත් සමඟ භාණ්ඩ සමීක්ෂණ කටයුතු නියමිත කාල රාමුවට අවසන් කිරීමට නොහැකි විය. ඒ අනුව මේ වනවිට 2018.12.31 දිනට ආරක්ෂක අමාත්‍යාංශයේ හඳුනාගත් ඌණතා හා අතිරික්තතා පිළිබඳව විමසීම් සඳහා කටයුතු කරමින් පවති. මීට අමතරව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල විසින් ඉදිරිපත් කරන ලද අනෙකුත් නිර්දේශ යටතේ අපහරණය කලයුතු භාණ්ඩ සම්බන්ධයෙන් අපහරණ මණ්ඩල පත් කිරීම් කටයුතු ද ආරම්භ කර එම කටයුතු ද අවසන් අදියරේ පවතී.
06. මු.රෙ.94 (1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇතිකර ගෙන තිබුණි.	අ. 2018 වර්ෂය අවසානයේදී ඉතිරියකින් ප්‍රතිපාදන මාරු කර ගැනීමේ අරමුණින් අදාළ කාර්යයන් වෙනුවෙන් බැරකම් වලට එළඹුනද වසර අවසාන කාර්තුවේ අක් මුදල් ප්‍රමාණවත් පරිදි නොලැබීම නිසා අපේක්ෂිත පරිදි කටයුතු කර නොමැත. නමුත් මේ වන විට ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට එලඹීමට කටයුතු නොකරන ලෙසට නිලධාරීන් දැනුවත් කර එවැනි තත්ත්වයන් ඇතිවීම වලක්වාගෙන ඇත.
07. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	අ. මෙයට පහත සඳහන් හේතු බලපා ඇති අතර, නිවැරදි කිරීමට ගත් ක්‍රියාමාර්ගද සඳහන් කර ඇත. (අ) ස්ථාන මාරුවීමේදී ණය නිරවුල් කිරීම් නිවැරදිව සිදු වී නොමැති නිලධාරීන්ගේ ණය ශේෂ නිවැරදිව ගිණුම් ගත කිරීමට මේ වන විට කටයුතු කර ඇත. (ආ) පොලිස්පති වෙත නිරවුල් වී තිබූ රාජ්‍ය බුද්ධි සේවාවේ හා පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන්ගේ ණය මුදල්, පොලිස්පති මඟින් නැවත ආරක්ෂක අමාත්‍යාංශය වෙත ගෙන්වාගෙන මාරු සටහන් මඟින් අදාළ ණය මුදල් නිරවුල් කර ගැනීමට මේ වන විට කටයුතු කර ඇත. (ඇ) සේවය හැර ගොස් ඇති නිලධාරීන් හා වැඩ තහනමට ලක් වූ නිලධාරීන් හට සෘජු දැනුම් දීම මඟින් ණය වාරික

	වශයෙන් අයකර ගැනීමට කටයුතු කර ඇත. (ඈ) විශ්‍රාම ගොස් ඇති නිලධාරීන්ගේ නිරවුල් නොවූ ණය ශේෂ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් ප්‍රතිපාදන වෙන් කරගෙන එම ණය නිරවුල් කිරීමට කටයුතු කර ඇත. (ඉ) ඒ අනුව ඉහත සඳහන් පරිදි කටයුතු කිරීම මඟින් 2019 වර්ෂය තුළදී පැවති ණය ශේෂයෙන් රු. 2,313,415.00 ක ණය මුදලක් නිරවුල් කරගෙන ඇත.
08. අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ ගලපා වෙනස්කම් මාසිකව සසඳා නොතිබුණි.	අ. TOD/ IMP /05 ආකෘති පත්‍රය ප්‍රකාරව 2018 වර්ෂයේ සහ 2019 වර්ෂයේ කාර්තු පදනමින් අදාළ වාර්තා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තුමේන්තුව වෙත ඉදිරිපත්කර ඇති අතර, 2020 වර්ෂයේ ජනවාරි සිට ජුනි මස දක්වා අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාර ශේෂය සමඟ මාසිකව සසඳා මාර්තු 31 දිනට සහ ජුනි 30 දිනට අදාළ කාර්තු වාර්තා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.
09. සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු කාර්යසාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි.	අ. කාර්යසාධන වාර්තාව සකස් කිරීමේදී, අමාත්‍යාංශයට අයත් ආයතන ගණනාවක් ඇති බැවින් එම ආයතනයන්ගෙන් තොරතුරු ලබා ගැනීමේදී සැලකිය යුතු කාලයක් ගතවීම මෙම ප්‍රමාදයට හේතු වී ඇත. එමෙන්ම භාෂා ක්‍රීත්වයෙන් වාර්තාව සකස් කිරීමේදී ඇතිවූ ප්‍රමාදයන් ද නිසා නියමිත දිනට වාර්තාව ඉදිරිපත් නොකිරීමට හේතු වී ඇත. ආ. එසේ වුවද, 2019 කාර්යසාධන වාර්තාව කොවිඩ් ව්‍යාප්තිය මධ්‍යයේ වුව මහත් පරිශ්‍රමයක් දරා නියමිත කාල වකවානුව තුල මුද්‍රණය කර නිම කිරීමට කටයුතු කරන ලදී. ඉදිරියේදී අදාළ ප්‍රමාදයන් වලක්වා ගැනීමට කටයුතු කරනු ලැබේ.

දෙවන කොටස	
01. ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි. 02. හඳුනාගත් තිරසර අරමුණු ඉලක්ක ලභා කර ගැනීම මැන බැලීම සඳහා කාර්යසාධන ඉලක්ක නියම කර නොතිබුණි.	අ. තිරසර සංවර්ධන උපාය මාර්ගයන් ජාතික ආරක්ෂාව යන විෂයට සෘජුව අදාළ වන ආකාරයට ඉලක්ක සහිතව හඳුනාගැනීම අපහසු වූ බැවින් තිරසර සංවර්ධන ඉලක්ක හෝ මැනබැලීම සඳහා 2018 වර්ෂයේ දර්ශක සකසා නොතිබුණි. නමුත් අමාත්‍යාංශ විෂයයන් සංශෝධනය කර නව විෂයන් අමාත්‍යාංශයේ විෂය පථයට එක් කිරීම හේතුකොටගෙන තිරසර සංවර්ධන ඉලක්ක කෙරෙහි දායකවන අරමුණු පුළුල් වශයෙන් හඳුනාගැනීමට හා ඒවා මැන බැලීම සඳහා දර්ශකයන් සකස් කිරීමට හැකියාව ලැබී ඇති අතර, එක් එක් අංශ අනුව හඳුනාගත් තොරතුරු 2019 වාර්තාවට ඇතුලත් කොට ඇත. ආ. තවද, මෙම අමාත්‍යාංශය විසින් තම විෂය පථයට අනුව ළඟා කර ගත යුතු අරමුණු තිරසර සංවර්ධන පනතට අනුව ඉදිරිපත් කිරීමේදී ඒ පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීම පිණිස තිරසර සංවර්ධන අධිකාරියෙහි තාක්ෂණ දායකත්වය ලබා ගැනීමට කටයුතු කර ඇත.
03. ආයතනයේ තිරසර අරමුණු ඉලක්ක ලභා කර ගැනීමට අදාළ වන නිශ්චිත පාර්ශව හඳුනාගෙන නොතිබුණි.	අ. තිරසර අරමුණු ඉලක්ක ලභා කර ගැනීමට අදාළ වන නිශ්චිත පාර්ශව හඳුනා නොගත්තද ත්‍රිවිධ හමුදාව ඇතුළු අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනයන්හි ක්‍රියාකාරකම් තුළ අන්තර්ගත ව්‍යාපෘති හා වැඩසටහන් මඟින් ආදාළ ඉලක්ක හා අරමුණු කෙරෙහි සෘජු හෝ වක්‍ර වශයෙන් දායකත්වය සපයන ව්‍යාපෘති හා වැඩසටහන් හඳුනා ගැනීමට උත්සාහ ගෙන ඇත.
04. 2018 අප්‍රේල් 27 දිනැති අංක MSDW/08/65 දරණ චක්‍රලේඛ විධි විධාන අනුව ඉටු කල යුතු තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පත්කල යුතු නියෝජිතයන් දෙදෙනා පිළිබඳ විස්තර අමාත්‍යාංශය වෙත වාර්තා කර නොතිබුණි.	අ. MOD/P&P/04/29 හා 2019.10.8 දිනැති ලිපිය මඟින් නිලධාරීන් දෙදෙනෙකු නියෝජිතයන් වශයෙන් නම් කර ඇත.

05. රාජ්‍ය පරිපාලන විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.	අ. 2018.01.24 දින නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අංක 02/2018 හි 05 ඡේදය ප්‍රකාරව ආයතනයක මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම, ආයතනයට අනන්‍ය වූ ක්‍රමවේදයක් නිර්මාණාත්මකව අනුගමනය කිරීම නිර්දේශ කර ඇති අතර, චක්‍රලේඛයේ දැක්වෙන ආකෘතිය ප්‍රකාරවම අදාළ සැලැස්ම පිළියෙල කළ යුතු බවට අනිවාර්ය කර නොමැත. ආ. ඒ අනුව 2018 වර්ෂය සඳහා මෙම අමාත්‍යාංශයට අනන්‍ය වූ අකෘතියකට අනුව මානව සම්පත් සැලැස්මක් සකස් කර නිබුණි. ඇ. කෙසේ වෙතත් 2020 වර්ෂයට අදාළව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 විධිවිධාන ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කර ඇත.
06. සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් එක් සේවකයෙකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12 ක අවම පුහුණුවක් නියම කර නොතිබුණි.	අ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 නිකුත් කර ඇත්තේ 2018.01.24 දිනැතිවය. එසේ වුවත්, 2018 වර්ෂය සඳහා වූ මානව සම්පත් සැලැස්ම පිළියෙල කර ඇත්තේ 2017 වර්ෂයේ මැද භාගයේදී, 2018 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු පිළියෙළ කිරීමට සමගාමීව වන අතර, එහිදී 2018 වර්ෂයේ පුහුණුවීම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම සිදු කර ඇත. ඒ අනුව පුහුණු අවශ්‍යතා සැලකිල්ලට ගෙන, පුහුණුවීම් අවශ්‍යතා සමායෝජනය කර පුහුණු පාඨමාලා පැවැත්වීමට කටයුතු කිරීමෙන් කාර්යය මණ්ඩලයේ දැනුම හා කුසලතා වර්ධනය කිරීමට කටයුතු යොදා ඇත. ආ. මේ වන විට අවම පැය 12ක පුහුණුවක් ලැබෙන පරිදි මානව සම්පත් සැලැස්ම සකස් කර ඇත.
07. සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතිණි.	අ. අමාත්‍යාංශයේ කාර්යය භාරයට අනුකූලව ඉලක්කගත කණ්ඩායම් හඳුනාගෙන තෝරාගත් පුහුණු වැඩසටහන් අදාළ කාල පරාසයන් තුල ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. තවද, පුහුණු අවස්ථා ප්‍රමාණය වැඩි කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

08. විගණකාධිපතිවරයා විසින් ඡේදවලින් පෙන්වා දී තිබූ අඩුපාඩු / දෝෂ නිවැරදි කරවාගෙන නොතිබුණි.	අ. මේ වන විට අඩුපාඩු අවමකර ගැනීමට කටයුතු කර ඇත.
09. ආයතනය විසින් ඉටුකරනු ලබන කාර්යභාරය හා සම්බන්ධිතව ප්‍රධාන කාර්ය දර්ශක 03 ක් හඳුනාගෙන නොතිබුණි.	2018 වර්ෂයේදී ප්‍රධාන කාර්ය දර්ශක හඳුනා ගැනීමට අපහසු වුවද, 2019 වර්ෂයේදී අමාත්‍යාංශයේ ආයතන වශයෙන් කාර්ය දර්ශක හඳුනාගෙන ඇත.

දීපිකා බුද්ධදාස
ප්‍රධාන මූල්‍ය නිලධාරි - I
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ.

02. ආපදා කළමනාකරණ අංශය

කම්ටුව විසින් හඳුනාගනු ලැබූ දුර්වලතා	දුර්වලතාවයන් සමථයකට පත් කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්ථමාන තත්ත්වය
01. විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	අ. ලැබෙන විගණන විමසුම් වලින් බොහෝමයක් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලින් තොරතුරු කැඳවා ඉදිරිපත් කල යුතු ඒවා වූ බැවින්, ඇතැම් විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීම ප්‍රමාද වී ඇත. විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු සැපයීමට ක්‍රියා කරන ලෙස අදාළ පාර්ශවයන් වෙත දැනුවත් කිරීම් සිදු කර ඇත.
02. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	අ. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු සපයන ලෙස අදාළ අංශ දැනුවත් කිරීමෙන් අනතුරුව හැකි සෑම අවස්ථාවකම පිළිතුරු මසක් ඇතුළත ලබාදීමට කටයුතු කර ඇත.
03.අනුමත සීමාව ඉක්මවා කාර්යය මණ්ඩලය බඳවාගෙන තිබුණි.	අ. අනුමත කාර්යය මණ්ඩලය ඉක්මවා නිලධාරීන් බඳවාගෙන නොමැත.
04. 2017.09.20 දිනැති 2017 අංක 4 දරණ කළමනාකරණ සේවා වක්‍රලේඛය ප්‍රකාරව කාර්යය මණ්ඩල තොරතුරු කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොතිබුණි.	අ. මේ වන විට කාර්යය මණ්ඩල තොරතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඊ තැපෑල මඟින් යොමුකර ඇති අතර, ඉදිරියේදී කළමනාකරණ සේවා වක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අදාළ තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.
දෙවැනි කොටස :	
01. හඳුනාගත් තිරසාර අරමුණු ඉලක්ක ලහාකර ගැනීම, මැන බැලීම සඳහා කාරයසාධන ඉලක්ක නියම කර නොතිබුණි.	අ. ආපදා කළමනාකරණ අංශය මඟින් අධීක්ෂණය කරනු ලබන ආයතනයන් විසින් තිරසර සංවර්ධන උපාය මාර්ගික සැලැස්ම මේ වන විට කෙටුම්පත් කර ඇත. එය තව දුරටත් වැඩිදියුණු කල යුතු බව 2020.03.10 දින තිරසර සංවර්ධන සභාවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ මූලිකත්වයෙන් පැවති දැනුවත්

	කිරීමේ වැඩ සටහනේදී උපදෙස් දෙන ලදී. ඒ අනුව අදාළ ආයතන ප්‍රධානීන් ඒ පිළිබඳව දැනුවත් කර ඉදිරි කටයුතු සිදුකර ඇත.
02. රාජ්‍ය පාලන විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.	අ. මේ වන විට අදාළ මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.
03. සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්ම මඟින් එක් සේවකයෙකු සඳහා අවම වශයෙන් පැය 12 ක පුහුණුවක් නියම කර නොතිබුණි.	අ. සකස් කර ඇති සැලැස්මේ එක් සේවකයෙකු සඳහා අවම වශයෙන් පැය 12 ක පුහුණුවක් නියම කර ඇත.
04. සමස්ථ කාර්යය මණ්ඩලය ඇතුළත්ව කාර්යසාධන ගිවිසුම් සකස් කර නොතිබුණි.	අ. අදාළ කාර්යසාධන ගිවිසුම් නිසි පරිදි සකස් කරමින් පවතී.
05. සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතිණි.	අ. නිලධාරීන්ගේ හැකියා වර්ධනය කිරීමේ අරමුණින් නිපුණතා සංවර්ධන ආයතනය, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය ආදී ආයතනයන්හි පුහුණු වැඩ සටහන් සඳහා නිලධාරීන් 18 දෙනෙකු යොමු කර ඇත. ආ. නිලධාරීන් 60 දෙනෙකු සඳහා තෙදින පුහුණු වැඩමුළුවක් කොත්මලේ, වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනයේදී පවත්වා ඇත. ඇ. දෙමළ භාෂා iv මට්ටම සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවෙන් කැඳවන ලද දේශකවරයෙක් මාර්ගයෙන් පැය 50 පාඨමාලාව සම්පූර්ණ කරන ලද නිලධාරීන් 14 ක් සඳහා අමාත්‍යාංශය විසින් සහතිකපත් නිකුත් කර ඇත. ඈ. ඒ අනුව සමස්ථයක් වශයෙන් අමාත්‍යාංශයේ විශාල පිරිසකට පැය 12 ට වැඩි පුහුණු අවස්ථා ලබා දී ඇත.

දීපිකා බුද්ධදාස
ප්‍රධාන මූල්‍ය නිලධාරී - I
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ.

03. නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය

කම්ටුව විසින් හඳුනාගනු ලැබූ දුර්වලතා	දුර්වලතාවයන් සමථයකට පත් කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්ථමාන තත්ත්වය
01. 2017.06.26 දිනැති 1/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොමිට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අ. 2017.06.28 දිනැති 1/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේ සිට මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු අදාළ කාර්තුව අවසානයේදී කොමිට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු වන අතර, ඒ සම්බන්ධයෙන් වන උපදෙස් ඉදිරියේදී නිකුත් කිරීමට කටයුතු කරන බව කොමිට්‍රෝලර් ජනරාල් විසින් දන්වා ඇත. නමුත් එම උපදෙස් මේ වනතෙක් නිකුත් වී නොමැත. එමෙන්ම එම චක්‍රලේඛයේ 6 ඡේදය මඟින් ඉල්ලා ඇති තොරතුරු එහි සඳහන් නියමිත දිනවලදී ඉදිරිපත් කර ඇත.
02. 2016.03.31 දිනැති අංක 5/2016 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අ. 2016.03.31 දිනැති 05/2016 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ සිදුකර අදාළ කටයුතු අවසන් කර ඇත. ඉදිරියේදී ප්‍රමාදයන් ඇති නොවන පරිදි කටයුතු කරනු ලැබේ.
03. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	අ. ගබඩා සමීක්ෂණ කටයුතු අවසානයේදී අනාවරණය වූ අතිරික්ත, ඌණතා පිළිබඳ නිර්දේශ හා අනෙකුත් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට මේ වන විටත් කටයුතු කර ඇත.
04. සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	අ. මේ වන විට ආයතනය සතු සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන කරමින් පවත්වාගෙන යනු ලබයි. ආ. මේ වන විට ආයතනය සතු වාහන වල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂා කටයුතු නිවැරදිව සිදු කරනු ලැබේ.

05. 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 හි සඳහන් පරිදි ආයතනය සතු වාහන වල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	අ. මේ වන විට ආයතනය සතු වාහන වල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂා කටයුතු නිවැරදිව සිදු කරනු ලැබේ.
06. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	අ. ඇගයීම සිදු කරන ලද 2018 වර්ෂය වනවිට නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ ව්‍යාපෘතියක් ලෙස පැවති විශේෂ කාර්ය බලකායේ අත්තිකාරම් "බී" ගිණුමේ පැවති හිඟ ණය ශේෂ කෙරෙහි මෙහිදී අවධානයට යොමු වී ඇත. මෙම හිඟ ණය ශේෂ කඩිනමින් නිරවුල් කරන ලෙස එවකට විශේෂ කාර්ය බලකාය වෙත උපදෙස් දී ඇත.
දෙවන කොටස :	
01. 2018.04.27 දිනැති අංක MSDW/08/65 දරණ චක්‍රලේඛ විධිවිධාන අනුව ඉටුකළ යුතු තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පත්කළ යුතු නියෝජිතයන් දෙදෙනා පිළිබඳ විස්තර අමාත්‍යාංශය වෙත වාර්තා කර නොතිබුණි.	අ. MSDW/08/65 චක්‍රලේඛය ප්‍රකාරව හා 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත අනුව තිරසර සංවර්ධන උපායමාර්ග සැකසීමට අදාළව නිලධාරීන් දෙදෙනෙකු පත් කර ඒ පිළිබඳව අවශ්‍ය දැනුම්දීම් සිදුකර ඇත.
02. පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	අ. පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි සකස් කොට ඇත.
03. ආයතනයේ පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	අ. ආයතනයේ පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කරමින් පවතී.
04. රාජ්‍ය පරිපාලන විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	අ. රා.ප.ව. 02/2018 ඇමුණුම ආකෘතිය පදනම් කර 2020 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්ම අදාළ විධිවිධාන ප්‍රකාරව සකස් කරනු ලැබේ.
5. සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් එක් සේවකයෙකු සඳහා අවම	අ. අවම පැය 12ක පුහුණුවක් ලැබෙන පරිදි 2020 වර්ෂයට අදාළ සැලැසුම් සකස් කරනු ලැබේ.

දීපිකා බුද්ධදාස
ප්‍රධාන මූල්‍ය නිලධාරි - I
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ.

වශයෙන් වර්ෂයකට පැය 12 ක අවම පුහුණුවක් නියම කර නොතිබුණි.	
06. සමස්ත කාර්යය මණ්ඩලය ඇතුළත්ව කාර්යසාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි.	අ. සමස්ත කාර්යය මණ්ඩලය සඳහා මේ වන විට කාර්යසාධන ගිවිසුම් සකස් කරමින් පවතී.
07. මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට	අ. මේ වන විට ඒ සඳහා අදාළ පත් කිරීම් සිදුකර ඇත.
08. සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	අ. ඉදිරියේදී සැලසුම් කරන ලද පුහුණු අවස්ථාවන් ප්‍රමාණ ලබා දීමේදී 50% කට වැඩි ඉහළ ප්‍රතිශතයක් පවත්වා ගැනීමට අවශ්‍ය විධිවිධාන සලසා ඇත.

දීපිකා බුද්ධදාස
ප්‍රධාන මූල්‍ය නිලධාරී - I
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ.

04. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

කමිටුව විසින් හඳුනාගනු ලැබූ දුර්වලතා	දුර්වලතාවයන් සමථයකට පත් කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්ථමාන තත්ත්වය
01. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	අ. යුද්ධ හමුදා අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද විගණන විමසුම් සඳහා කිසියම් ආයතනයක් විසින් සති තුනක් තුළ පිළිතුරු ඉදිරිපත් නොකරන්නේනම් ඒ පිළිබඳව අදාළ ආයතනයන් වෙත සිහිකැඳවීම් සිදුකරන අතරමේ වනවිට බොහෝ , න්තර වඅායතන වෙතින් අභ්‍යාගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ලැබෙමින් පවතී.
02. විගණන හා කළමනාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර දෙකක් පවත්වා නොතිබුණි.	අ. 2018 වර්ෂයට අදාළව පහත සඳහන් දිනයන්හිදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර දෙකක් පවත්වා ඇත. I. 2018.04.09 හා 2018.11.13
03. මු.රෙ. 94 (1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇති කරගෙන තිබුණි.	අ. 2018 වර්ෂයේ ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම් ඇතිකර ගැනීමට හේතු වූ කරුණු පහත පරිදි වේ. I. ප්‍රමාණවත් ද්‍රවශීල මුදල් නොමැති වීම හේතුවෙන් 2017 වර්ෂයෙන් 2018 වර්ෂයට රුගෙන එන ලද බැරකම් නිරවුල් කිරීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙතින් ප්‍රතිපාදන ඉල්ලුම් කලද ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් නොකිරීම හේතුවෙන් 2018 වර්ෂයේ යුද්ධ හමුදාවට වෙන්කල ප්‍රතිපාදන තුලින් එම බැරකම් නිරවුල් කිරීමට සිදුවීම. II. තවද, පුනරාවර්ථන හා මූලධන වැය ශීර්ෂ යටතේ වෙන්කරන ලද ප්‍රතිපාදන තුළින් විවෘත කරන ලද විදේශීය ණයවර ලිපිවල වටිනාකම (රුපියලේ අගයට සාපේක්ෂව ඇ.ඩො. අගය ඉහල යාම) විවලනය වීම හේතුවෙන් ඇස්තමේන්තුගත වියදමට වඩා වෙළඳපොල වටිනාකම ඉහල යාම. ආ . ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම් ඇතිකර ගැනීම මහහරවා ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත. I. වාර්ෂිකව වෙන්කරන ලද අයවැය සීමාව තුල ප්‍රසම්පාදන

	සැලසුම් පිළියෙල කිරීමට වැය විෂයභාර ප්‍රතිපත්ති පාලන හා ක්‍රියාකාරී පාලන නිලධාරීන් දැනුවත් කිරීම. II. වාර්ෂිකව වෙන්කරන ලද ප්‍රතිපාදන ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රසම්පාදන කටයුතු සිදුකරන බවට අඛණ්ඩව සමාලෝචනය කිරීමට ක්‍රියාකාරී පාලන නිලධාරීන් දැනුවත් කිරීම. III. මාසිකව වැය ශීර්ෂයන්හි වැය දැරීමේ ප්‍රගතිය පිළිබඳව ප්‍රගති සමාලෝචනය සිදුකොට ඒ අනුව අනුමත සීමාව තුල බැරකම් ඇති කරගෙන ඇති බව තහවුරු කර ගැනීම. IV. වාර්ෂිකව වෙන්කරන ලද අයවැය සීමාව තුල පමණක් ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට වැය ශීර්ෂභාර ප්‍රතිපත්ති හා ක්‍රියාකාරී පාලන නිලධාරීන් වෙත උපදෙස් ලබාදීම. V. වර්ෂ අවසානයේදී වැය ශීර්ෂයන්හි වැය දැරීමේ ප්‍රගතිය අනුව වෙන්කර දී ඇති ප්‍රතිපාදන උපරිම අයුරින් උපයෝජනය කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන මු.රෙ. 66 ප්‍රකාරව ක්‍රියාකර ප්‍රතිපාදන සලසා ගැනීම පිළිබඳව ප්‍රතිපත්ති හා ක්‍රියාකාරී පාලන නිලධාරීන් වෙත උපදෙස් ලබාදීම.
04 . වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	අ. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ 2018.12.31 දිනට වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂය රු.69,121,778.65 ක් වූ අතර, එය නිරවුල් කිරීමේ ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

විස්තරය	2018.12.31 දිනට ශේෂය රු. ශත	2020.06.30 දිනට නිරවුල්වීම් රු. ශත	2020.06.30 දිනට ශේෂය රු. ශත	නිරවුල් වීමේ ප්‍රගතිය
මිය ගිය	1,332,959.10	1,087,500.00	245,459.10	**82%**
විශ්‍රාම ගිය	3,706,923.69	1,937,748.24	1,769,175.45	**52%**
වැඩ කහනම්කළු	246,390.78	138,500.00	107,890.78	**56%**
සේවය හැර ගිය	63,835,505.08	17,796,555.86	46,038,949.22	**28%**
එකතුව	**69,121,778.65**	**20,960,304.10**	**48,161,474.55**	**30%**

	ආ. තවදුරටත් නිරවුල් කිරීමට ඇති රු.48,161,474,55 ණය ශේෂය නිරවුල් කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ගවල ප්‍රගතිය මාසිකව අධීක්ෂණය කරනු ලැබේ. එමෙන්ම කාර්තුවකට වරක් පවත්වනු ලබන

	දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී හිඟහිටි ණය ශේෂ නිරවුල් කිරීමේ ප්‍රගතිය සාකච්ඡා කරනු ලබන අතර, එහිදී එම ණය ශේෂ කඩිනමින් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදෙනු ලැබේ.
05. සමාලෝචිත වර්ෂය අවසානයට මුදල් පොතේ පැවති ශේෂය අදාළ චක්‍රලේඛ විධිවිධාන අනුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත නියමිත දිනට ප්‍රේෂණය කර නොතිබුණි.	අ. මහා භාණ්ඩාගාරයෙන් යුද්ධ හමුදාව වෙත අග්‍රිම නිකුත් කරනු ලබන බැංකු ගිණුම, ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ ගිණුම් අංක 7041324 දරන බැංකු ගිණුම වන අතර, මෙම බැංකු ගිණුමට අදාළ මුදල් පොතේ 2018.12.31 දිනට මුදල් ශේෂයක් නොතිබූ බැවින් 2019.01.01 දින හිස් වාර්තාවක් මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇත. ආ. බැංකු අණකර මඟින් ගෙවීම් කිරීම සඳහා යුද්ධ හමුදාධිපති නමින් ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ ගිණුම් අංක 7041325 දරන බැංකු ගිණුම භාවිතා කරන අතර, 2018.12.31 දිනට මෙම බැංකු ගිණුමට අදාළ මුදල් පොතේ ශේෂය රු.11,135,081.96 කි. මුදල් පොතේ පැවති අවසන් ශේෂය බැංකු අණකර මඟින් ගෙවීමට සිදුවන බැවින් වර්ෂයක් අවසානයේ මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය නොකෙරේ.
06. මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	අ. 2018.12.31 දිනට නොපියවූ අග්‍රිම ශේෂය රු.85,249,221.58 ක්ව පැවති අතර,2020.06.30 දින වන විට එම ශේෂයෙන් රු.77,705,046.67 ක් අයකර දැනට පියවීමට රු.7,544,174.91 ක් වූ මුදලක් ඇත.නිකුත් කරනු ලබන අතුරු අග්‍රිම මු.රෙ. 371 ප්‍රකාරව අදාළ වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවසන් කළයුතු වුවද 2018.12.31 දිනට පැවති අග්‍රිම ශේෂය තුළ අදාළ කාර්යය අවසන් නොවීම (උදා : එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරි හේතුවෙන් නොපියවන ලද අත්තිකාරම් / වෙනත් පැහැරහැරීම් හේතුවෙන් නීතිමය ක්‍රියාමාර්ග වලට යොමුකරන ලද අග්‍රිම ශේෂයන්) මත නිරවුල්නොකළ ශේෂයන් ඇතුළත් වේ. ආ. සෑම වර්ෂයම දෙසැම්බර් 31 දිනට ප්‍රථම අග්‍රිම ශේෂයන් පියවා අවසන් කළයුතු බවට අදාළ අංශ දැනුවත් කර ඇති අතර,සුළු මුදල් අග්‍රිම සියල්ල 2020.06.30 දින වනවිට පියවා අවසන් කර ඇත.එමෙන්ම නොපියවූ අග්‍රිම ශේෂයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකර නිරන්තරයෙන් අදාළ අංශයන් දැනුවත්කර පසු විපරම් කරනු ලැබේ.

07. සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු කාර්යසාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත්කර නොතිබුණි.	අ. 2018 වර්ෂයට අදාළ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කිරීමෙන් පසු අදාළ වාර්තාවේ මුද්‍රිත පිටපත් 60 ක් සහ සංයුක්ත තැටි 360 ක ප්‍රමාණයක් පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත 2019.09.05 දින බාර දී ඇත.
08. ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	අ. යුද්ධ හමුදා වෙබ් අඩවියෙහි පලකර ඇති විද්‍යුත් ලිපිනය සහ දුරකථන අංකය මඟින් මහජනතාවට පැමිණිලි හෝ ප්‍රශංසා කිරීම සඳහා අවස්ථාව සලසා දී ඇත.
09. 2018 අප්‍රේල් 27 දිනැති අංක MSDW/08/65 දරණ චක්‍රලේඛ විධි විධාන අනුව ඉටු කළයුතු තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පත්කළ යුතු නියෝජිතයන් දෙදෙනා පිළිබඳ විස්තර අමාත්‍යාංශය වෙත වාර්තාකර නොතිබුණි	අ. අදාළ චක්‍රලේඛය අනුව තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා මූකශා/අවි/අම/02(108) හා 2020 ජූලි 22 දරන ලිපිය මඟින් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකු පත්කර ඇත.
10. අයවැය චක්‍රලේඛය අනුව අවම වශයෙන් නිමවුම් දර්ශක තුනක් හඳුනාගෙන ලේඛනගත කර නොතාබුණි.ආයතනය විසින් ඉටුකරනු ලබන කාර්ය භාරය හා සම්බන්ධිතව ප්‍රධාන කාර්ය දර්ශක 03 ක් හඳුනාගෙන නොතිබුණි.	අ. අදාළ චක්‍රලේඛයට අනුව සමස්ථ යුද්ධ හමුදාවම නියෝජනය වන පරිදි නිමවුම් දර්ශක (KPIs) හඳුනාගෙන ලේඛන ගත කිරීම සඳහා මණ්ඩලයක් පත්කර ඇති අතර එම මණ්ඩලයේ නිගමන අනුව ඉදිරි කටයුතු සිදුකරනු ලබයි.
11. හඳුනාගත් පළමු කාර්ය සාධක දර්ශකයේ ලගාවීම 50% කට වඩා අඩු ප්‍රමාණයෙන් විය. හඳුනාගත් තුන්වන කාර්යසාධක දර්ශකයේ ලභාවීම 50% ට වඩා අඩු මට්ටමක විය.	

දීපිකා බුද්ධදාස
ප්‍රධාන මූල්‍ය නිලධාරී - I
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ.

05. ශ්‍රී ලංකා නාවික හමුදාව

කමිටුව විසින් හඳුනාගනු ලැබූ දුර්වලතා	දුර්වලතාවයන් සමථයකට පත්කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග/වර්තමාන තත්ත්වය
පළමු කොටස :	
01. මූල්‍ය බලතල පැවරීමේදී සෑම ගණුදෙනුවක්ම අවම තරමින් නිලධාරීන් දෙදෙනෙකුගේ පරීක්ෂාවට ලක්වන පරිදි බලතල පවරා නොතිබුණි.	අ. මු.රෙ. 135 - 139 ප්‍රකාරව සෑම ගණුදෙනුවක් සඳහාම නිලධාරීන් සිව් දෙනෙකුගේ පරීක්ෂාවට ලක්වන පරිදි මූල්‍ය බලතල පවරා ඇත.
02. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	අ. අභ්‍යන්තරව විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීමේදී ඇතැම් විගණන විමසුම් සම්බන්ධයෙන් පරීක්ෂණ මණ්ඩල මඟින් පිළිතුරු සැපයීම වඩා සුදුසු වන අවස්ථාවන්හිදී පිළිතුරු ප්‍රමාද වී ඇත. තවද, නෞකා දිර්ඝ මුහුදු සංචාර වල නිරත වන අවස්ථා වලදී පිළිතුරු මසක් ඇතුලත ලබා දීමට නොහැකි වූ අවස්ථා ඇත. තත්ත්වය එසේ වුවද ඉදිරියේදී ප්‍රමාදයන් අවම කර ගැනීමට කටයුතු කර ඇත.
03. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාර 2018.08.01 දිනෙන් පසුව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අ. 2019 ජූලි මස 18 වන දින සිට නාවික හමුදා අභ්‍යන්තර විගණන ඒකකයට අයත් nhqdnia@gmail.com දරණ විද්‍යුත් ලිපිනය මඟින් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට අයත් dmatreasury.aq@gmail.com දරණ විද්‍යුත් ලිපිනය වෙත අභ්‍යන්තර විගණන වාර්තාවලට අදාළ පිටපත් යොමු කර ඇත.
04. 2017.06.26 දිනැති අංක 1/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොමිට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අ. නාවික හමුදාව සතුව ඇති සියලුම මූල්‍ය නොවන වත්කම් සම්බන්ධයෙන් වාර්තාවක් මෙතෙක් කොමිට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොමැති අතර, අංක 01/2017 දරණ චක්‍රලේඛය ප්‍රකාරව අදාළ වාර්තාව කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී.

05. 2017.06.26 දිනැති අංක 1/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 13 ඡේදය ප්‍රකාරව චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියෙකු පත්කර කොමිසෝ ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අ. සුදුසු නිලධාරියෙකුගේ නම හා විස්තරය ඇතුලත් පෝරමය කොමිසෝ ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
06. වාහනයක් ගර්හීත වී මාස 6 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	අ. නාවික හමුදාව සතු වාහනයක් ගර්හීත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කිරීමට අපොහොසත් වී ඇත්තේ එම වාහන අපහරණය කිරීමේදී පුවත්පත් දැන්වීම් පල කර එහි අනුමැතිය ලැබීමෙන් පසු සිදුකරනු ලබන තක්සේරු කටයුතු සහ අනෙකුත් ටෙන්ඩර් ක්‍රියාපටිපාටියට අදාළ කටයුතු සිදු කිරීමේදී ප්‍රමාදයන් හේතුවෙන් වන අතර, මින් ඉදිරියට අදාළ කාර්ය කාර්යක්ෂමව සිදු කිරීමට අදාළ දෙපාර්තමේන්තු වෙත උපදෙස් ලබාදී ඇත.
07. 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	අ. නාවික හමුදාවේ වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳව පරීක්ෂාවන් නිසිලෙස සිදු කරනු ලබන අතර, මේ සම්බන්ධයෙන් නාවික නියෝග 0310 (සී) මඟින්ද වැඩි දුරටත් කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත.
08. ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් දැරීම සිදුව තිබුණි.	අ. හැකි සෑම අවස්ථාවකම ප්‍රතිපාදන සීමාවන් ඇතුලත සියලු වියදම් දරා ඇත.
09. මු.රෙ. 94 (1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයන් උපයෝජනය කල පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැදීම් ඇති කර ගෙන තිබුණි.	අ. ප්‍රතිපාදන උපයෝජනය කිරීමේදී අනුමත සීමාවට යටත්ව සිදු කර ඇති අතර, ඉතිරි ප්‍රතිපාදන අනුමත සීමාවන් ඉක්මවා සිදු කිරීමට අත්‍යවශ්‍ය වූ අවස්ථාවන්හිදී මු.රෙ. 94(2) සහ 94(3) මඟින් සලසා ඇති ප්‍රතිපාදන අනුව කටයුතු කර ඇත.

10. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	අ. 2020.01.31 වන විට වර්ෂයකට වැඩි හිඟ ණය ශේෂ වලින් රු.1,288,669.79 ක් අයකරගෙන ඇති අතර, තවත් රු.18,180,159.41 ක මුදලක් කපා හැරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
11. මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්යය අතුරු අග්‍රිම කාර්යය නිම වී මාසයක් ඇතුලත නිරවුල් කර නොතිබුණි.	අ. මෙම අතුරු අග්‍රිමයන් නාවික හමුදාවේ නෞකාවන් විදෙස් රටවල් වල සංචාරය කිරීමේදී දැරීමට සිදු වූ වියදම් වෙනුවෙන් නිකුත් කර ඇති අතර, රාජකාරී ස්වභාවය අනුව අග්‍රිමයන් නිරවුල් කිරීමට කාලයක් ගතවී ඇත. මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර ඉදිරියේදී එසේ නොවීමට කටයුතු කිරීම සඳහා උපදෙස් ලබා දී ඇත.
12. මු.රෙ. 371 හි වන සීමාව ඉක්මවා තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.	අ. තත්කාර්යය අතුරු අග්‍රිමයන් නිකුත් කොට ඇත්තේ නාවික හමුදාවට පවරා ඇති ජනාධිපති කාර්යාලය මඟින් ක්‍රියාත්මක වන ප්‍රතිආශ්‍රැත කරන ජල පද්ධති 500 ක් කඩිනමින් ඉදිකිරීමේ කටයුතු සඳහාය. එම ඉදිකිරීම් එකවර විවිධ ප්‍රදේශයන් කිහිපයක් තුළ සිදුකල යුතු බැවින්, ඒ සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරියෙකු පත්කර ඔහුට ඒ සඳහා රු.100,000.00 බැගින් වූ තත්කාර්යය අතුරු අග්‍රිම කිහිපයක් නිකුත් කිරීමට සිදුව ඇත. එම ව්‍යාපෘති එවකට පැවති ජාතික අවශ්‍යතාවයක් වූ බැවින් අදාළ අග්‍රිමයන් සඳහා ආරක්ෂක අමාත්‍යාංශය මඟින් අනුමැතිය ලබාදී ඇති අතර, 2018 ජුනි මස 12 වන දින ව්‍යාපෘති අධ්‍යක්ෂ (වකුගඩු නිවාරණය පිළිබඳ ජනාධිපති කාර්යසාධන බලකාය) විසින් මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා පමණක් භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගන්නා තුරු පෙර පරිදිම තත්කාර්යය අතුරු අග්‍රිමය නිදහස් කිරීමට කටයුතු කරන ලෙස දන්වා ඇත. මේ පිළිබඳව අවධානය යොමු කර ඉදිරියේදී එසේ නොවීමට කටයුතු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.
13. අදාළ විධිවිධාන වලට අනුකූලව රැස් කල ආදායම් ආපසු ගෙවා නොතිබුණි.	අ. නාවික හමුදා නිල බැංකු ගිණුමට ලැබෙන හදුනා නොගත් ලැබීම් හදුනා ගන්නා තෙක් රඳවා ගනු ලබන අතර, වර්තමානයේ හදුනා නොගත් ලැබීම් කඩිනමින් රජයේ ආදායමට බැර කරනු ලැබේ.

දෙවන කොටස :	
01. ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි.	අ. දෙවන කොටසට අදාළ සියලු කරුණු සඳහා 2018 අප්‍රේල් මස 27 වන දිනැති අංක MSDW/08/65 දරණ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීමට නාවික හමුදාධිපති විසින් විධිමත් අධ්‍යයන මණ්ඩලයක් පත්කොට ඇති අතර, එහි නිර්දේශ ලැබුනු පසු ඒ අනුව ඉදිරියේදී කඩිනමින් අවශ්‍යය පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ.
02. හඳුනාගත් තිරසර අරමුණු ඉලක්ක ලහාකර ගැනීම, මැන බැලීම සඳහා කාර්යසාධන ඉලක්ක නියම කර නොතිබුණි.	
03. ආයතනයේ තිරසර අරමුණු ඉලක්ක ලහාකර ගැනීමට අදාළ වන නිශ්චිත පාර්ශව හඳුනාගෙන නොතිබුණි.	
04. 2018 අප්‍රේල් 27 වන දිනැති අංක MSDW/08/65 දරණ චක්‍රලේඛ විධිවිධාන අනුව ඉටු කල යුතු තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පත්කල යුතු නියෝජිතයන් දෙදෙනා පිළිබඳ විස්තර අමාත්‍යාංශය වෙත වාර්තා කර නොතිබුණි.	
05. රාජ්‍ය පරිපාලන විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	
06. සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් එක් සේවකයෙකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12 ක අවම පුහුණුවක් නියම කර නොතිබුණි.	
07. සමස්ත කාර්යය මණ්ඩලයට ඇතුලත්ව කාර්යසාධන ගිවිසුම් සකස්කර ගිවිසුම්ගතව නොතිබුණි.	
08. මානව සම්පත් සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් නම් කර නොතිබුණි.	

දීපිකා බුද්ධදාස
ප්‍රධාන මූල්‍ය නිලධාරි - I
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ.

06. ශ්‍රී ලංකා ගුවන් හමුදාව

කම්ටුව විසින්හඳුනාගනු ලැබූ දුර්වලතා	දුර්වලතාවයන් සමථයකට පත්කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග/වර්තමාන තත්ත්වය
පළමු කොටස :	
01. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	අ. 2018 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී කිසියම් වූ අතිරික්ත හෝ ඌනතා අනාවරණය නොවූ අතර, 2018 වර්ෂයට අදාළ සියලුම නිර්දේශ ක්‍රියාත්මක කර ඇත.
02. ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	අ. සමීක්ෂණ මණ්ඩල නිර්දේශ මත භාවිතයෙන් ඉවත් කරන ලද වාහන 81ක් 2020 ආරම්භයේදී ප්‍රසිද්ධ වෙන්දේසියක් මඟින් විකිණීමට නියමිතව තිබූ අතර, කොරෝනා (COVID 19) වසංගතය හේතුවෙන් එම කටයුතු සිදුකිරීමට නොහැකි විය. එම නිසා භාවිතයෙන් ඉවත් කරන ලද වාහන 81 සඳහා තරඟකාරී ලංසු කැඳවීමක් මත විකිණීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
03. මු.රෙ. 94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇතිකර ගෙන තිබුණි.	අ. මු.රෙ. 94 (1) ප්‍රකාරව වැය විෂයන් සඳහා සලසා තිබුන ප්‍රතිපාදන මඟින් අනුමත සීමාවන් කළමනාකරණය කරගනිමින් බැඳීම් කටයුතු සිදු කර ඇත. නමුත් ගුවන්යානා නඩත්තු කිරීම් වැනි අත්‍යවශ්‍ය කටයුතු වලදී වෙනත් විකල්ප නොමැතිවීම හේතුවෙන් සීමාවන් ඉක්මවා බැඳීම් සිදු කිරීමට සිදු වී ඇත. තවද, මෙම ගුවන්යානා නඩත්තු කටයුතු සිදු කිරීමේදී විදේශීය ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා දීර්ඝ කාලයක් ගත වීම හේතුවෙන් භාණ්ඩ නියමිත කාලවලදී ලබා ගත යුතු බැවින් මේ ලෙස සීමාවන් ඉක්මවා බැඳීම් කිරීමට සිදු වී ඇත. කෙසේ වෙතත් අනුමත සීමාවන් ඉක්මවා බැරකම් වලට එලඹී නැත. එම නිසා සැපයුම්කරුවන් වෙත බිල්පත් පියවීමේදී ගැටලුකාරී තත්ත්වයන් ඇති නොවිණි.
04. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය	අ. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුමේ 2018 දෙසැම්බර් මස 31 දිනට සිවිල් අංශයේ හිඟව පැවති

<table>
<tr><td>ශේෂ පැවතුණි.</td><td>රු.17,963,767.98 ක ශේෂය 2020 ජුනි මස 30 දින වන විට රු. 12,471.353.59 දක්වා අඩු කර ඇත. ඉතිරි හිඟ ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් අඛණ්ඩව කටයුතු ක්‍රියාත්මක කරමින් පවතී.

ආ. තවද, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ‘බී’ ගිණුමේ 2018 දෙසැම්බර් මස 31 දිනට සේවා අංශයට අදාළ වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන රු. 609,917.91 ක ණය ශේෂය 2019 වර්ෂයේදී සම්පූර්ණයෙන් අයකර ගෙන ඇත.</td></tr>
<tr><td>5. 2017.09.20 දිනැති 2017 අංක 4 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛ ප්‍රකාරව කාර්යය මණ්ඩල තොරතුරු කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුලත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොතිබුණි.</td><td>අ. 2017.09.20 දිනැති 2017 අංක 4 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛ ප්‍රකාරව සෑම කාර්තුවක් අවසානයෙහිම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත කාර්යය මණ්ඩල තොරතුරු යොමු කරන ලද අතර, 2018 වර්ෂයේ පළමු කාර්තුවේ සිට 2020 වර්ෂයේ දෙවන කාර්තුව සඳහා යොමු කිරීම් පහත පරිදි වේ.
<table>
<tr><th>කාර්තුව</th><th>යොමුව</th><th>යොමුකල දිනය</th></tr>
<tr><td>2018 පළමු කාර්තුව</td><td>ශ්‍රීලංගුහ/458/6/සං විධාන</td><td>2018 අප්‍රේල් මස 27 වැනි දින</td></tr>
<tr><td>2018 දෙවන කාර්තුව</td><td>ශ්‍රීලංගුහ/458/6/සං විධාන</td><td>2018 ජුලි මස 04 වැනි දින</td></tr>
<tr><td>2018 දෙවන කාර්තුව</td><td>ශ්‍රීලංගුහ/458/6/සං විධාන</td><td>2018 ජුලි මස 04 වැනි දින</td></tr>
<tr><td>2018 තෙවන කාර්තුව</td><td>ශ්‍රීලංගුහ/458/6/සං විධාන</td><td>2018 ඔක්තෝම්බර් මස 16 වැනි දින</td></tr>
<tr><td>2018 සිව්වන කාර්තුව</td><td>ශ්‍රීලංගුහ/458/6/සං විධාන</td><td>2019 පෙබරවාරි මස 07 වැනි දින</td></tr>
<tr><td>2019 පළමු කාර්තුව</td><td>ශ්‍රීලංගුහ/458/6/සං විධාන</td><td>2019 අප්‍රේල් මස 05 වැනි දින</td></tr>
<tr><td>2019 දෙවන කාර්තුව</td><td>ශ්‍රීලංගුහ/458/6/සං විධාන</td><td>2019 ජුලි මස 31 වැනි දින</td></tr>
<tr><td>2019 තෙවන කාර්තුව</td><td>ශ්‍රීලංගුහ/458/6/සං විධාන</td><td>2019 ඔක්තෝම්බර් මස 14 වැනි දින</td></tr>
<tr><td>2019 සිව්වන කාර්තුව</td><td>ශ්‍රීලංගුහ/458/6/සං විධාන</td><td>2020 ජනවාරි මස 22 වැනි දින</td></tr>
<tr><td>2020 පළමු කාර්තුව</td><td>ශ්‍රීලංගුහ/458/6/සං විධාන</td><td>2020 මැයි මස 11 වැනි දින</td></tr>
<tr><td>2020 දෙවන කාර්තුව</td><td>ශ්‍රීලංගුහ/458/6/සං විධාන</td><td>2020 ජුලි මස 08 වැනි දින</td></tr>
</table></td></tr>
</table>

දීපිකා බුද්ධදාස
ප්‍රධාන මූල්‍ය නිලධාරි - I
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ.

07. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

කමිටුව විසින් හඳුනාගනු ලැබූ දුර්වලතා	දුර්වලතාවයන් සමථයකට පත්කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග/වර්තමාන තත්ත්වය
පළමු කොටස :	
01. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුල ක්‍රියාත්මක කර නොතිබුණි.	අ. නිරීක්ෂණය සමග එකඟ වෙමි. පෙන්වාදෙන ලද අඩුපාඩු දැනට නිවැරදි කරමින් පවති. සියලු බලකා කාර්යාල හා පුහුණු පාසල්වල භාණ්ඩ එක් ස්ථානයකට එකතු කර වෙන්දේසි කිරීමේ කටයුතු මේ දිනවල සිදුවේ.
02. වාහනයක් ගර්හීත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	අ. වාහන සංචිතය තුල ඇති යතුරු පැදි 172 ක් හා වාහන 02 ක් පමණ වෙන්දේසි කල අතර, තවත් වාහන 06 ක්, ත්‍රීවිල් 05 ක් හා යතුරු පැදි 10 ක ප්‍රමාණයක් වෙන්දේසි කිරීමේ ක්‍රියාවලියේ පවතී.
03. මු.රෙ. 94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇති කර ගෙන තිබුණි.	අ. අංක 2103 වැය විෂය පමණක් අතපසු වීමකින් ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට බැඳී ඇති බව කාරුණිකව සඳහන් කරන අතර, එවැනි අතපසුවීම් වළක්වා ගෙන 2019 වර්ෂයේදී ප්‍රතිපාදන ඉතිරි සීමාවන් ඉක්මවා බැඳීම් වලට බැඳී නොමැති බවද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.
දෙවන කොටස :	
01. 2018.04.27 දිනැති අංක MSDW/08/65 දරණ වක්‍රලේඛ විධිවිධාන අනුව ඉටු කල යුතු තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පත්කළ යුතු නිලධාරීන් දෙදෙනා පිළිබඳ විස්තර අමාත්‍යාංශය වෙත වාර්තා කර නොතිබුණි.	අ. මේ සම්බන්ධව මීට පෙර පත්කර තිබූ නිලධාරීන් ස්ථාන මාරු ලැබ ගොස් ඇති බැවින්, 2020 වර්ෂයේ සිට තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පහත නම් හා නිල දරණ නිලධාරීන් දෙදෙනා පත් කර ඇත. I. කර්නල් ජීඩීඑච්කේ විජේනායක - අධ්‍යක්ෂ (ව්‍යාපෘති) II. ලුතී කර්නල් එල් රංවගොඩ - අධ්‍යක්ෂ (සුබසාධන)

02. පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙළ කර ක්‍රියාත්මක කර නොතිබුණි. ආයතනයේ පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	අ. 2018 වර්ෂයේ දෙවන කාර්තුව වන විට බම්බලපිටිය සිට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු මූලස්ථානය මොරටුව දක්වා ස්ථාන මාරු කිරීමට අදාළ ක්‍රමික ඉවත්කිරීම් කටයුතු සිදු වූ බැවින් පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්බන්ධ රාජකාරීන් මහහැරී ගොස් ඇති අතර, මේ වන විට එම ප්‍රඥප්ති ගත අනුශාංගික රාජකාරීන් ඉටු කිරීම ආරම්භ කර ඇත.
03. සමස්ථ කාර්යය මණ්ඩලය ඇතුලත්ව කාර්යසාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි.	අ. මේ වනවිට අදාළ කාර්යසාධක දර්ශක සකස් කරමින් පවතී.

දීපිකා බුද්ධදාස
ප්‍රධාන මූල්‍ය නිලධාරි - I
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ.

08. ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව

කම්ටුව විසින්හඳුනාගනු ලැබූ දුර්වලතා	දුර්වලතාවයන් සමථයකට පත්කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග/වර්තමාන තත්ත්වය
පළමු කොටස :	
01. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට ඉදිරිපත් කර නැත.	අ. 2018 වර්ෂයේ නව ක්‍රමවේදය අනුව මූල්‍ය ප්‍රකාශන ප්‍රථම වරට සකස් කිරීම හේතුවෙන් ඊට අදාළ ආකෘතිපත් 2019 මාර්තු මස 12 වන දින වන විට සම්පූර්ණ කිරීමට හැකි විය. එම නිසා 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇති අතර, ඊට පසු වර්ෂයන්ට අදාළ මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.
02. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි.	අ. ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ද්විතීක පදනම මත ශ්‍රී ලංකා නාවික හමුදාව වෙතින් කාර්යය මණ්ඩලය අනුයුක්ත කර ඇති බැවින් රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන යනු නොලැබේ.
03. මූල්‍ය බලතල පැවරීමේදී සෑම ගනුදෙණුවක්ම අවම තරමින් නිලධාරීන් දෙදෙනෙකුගේ පරීක්ෂාවට ලක්වන පරිදි බලතල පවරා නොතිබුණි .	අ. මූල්‍ය බලතල පැවරීමේදී අවම වශයෙන් නිලධාරීන් දෙදෙනෙකුගේ පරීක්ෂාවට ලක්වන පරිදි බලතල පවරා ඇති අතර, ඊට අදාළ ලිපිය 2018.02.09 වන දිනැති අංක DGCG/LOG/04 දරණ ලිපිය මඟින් ආරක්ෂක අමාත්‍යාංශය වෙතද ඉදිරිපත් කර ඇත.
04. 2004.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ පළවෙනි මුරපදය ගණකාධිකාරි හෝ අවසරලත් මාණ්ඩලික නිලධාරියෙකු පමණක් භාවිතා කර නොතිබුණි.	අ. ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සේවය කරන සියළුම නාවික පුද්ගලයින් සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව වෙතින් වැටුප් ගෙවීම සිදුකරන නිසා වැටුප් සකස් කිරීමේ මෘදුකාංගය භාවිතා කරනු නොලැබේ.

05. 2004.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණකයට අදාළ පළමු, දෙවන සහ තෙවන මුරපද තුන්මසකට වරක් වත් වෙනස් කර නොතිබුණි.	අ. ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සේවය කරන සියළුම නාවික පුද්ගලයින් සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව වෙතින් වැටුප් ගෙවීම සිදුකරන නිසා වැටුප් සකස් කිරීමේ මෘදුකාංගය භාවිතා කරනු නොලැබේ.
06. විගණන හා කළමනාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර 2 ක් වත් පවත්වා නොතිබුණි.	අ. දැනට ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව තුල අභ්‍යන්තර විගණන නිලධාරී විසින් වාර්ෂික කාල සටහනක් අනුව දෙපාර්තමේන්තුව තුළ ඇති අංශ වල විගණනයක් සිදු කරනු ලබයි. එහිදී මතුවන නොවිසඳුන ගැටළු පිළිබඳ සමාලෝචනය සඳහා අදාළ අංශ ප්‍රධානීන් හා අභ්‍යන්තර විගණන නිලධාරී සමඟ කාර්තුවකට වරක් අභ්‍යන්තර විගණන කළමනාකරණ කමිටුව රැස්කිරීම සඳහා ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.
07. 2017.06.26 දිනැති අංක 1/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොමිට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අ. වර්ෂය තුල මිලදී ගනු ලබන වත්කම් සහ අපහරණයන් පිළිබඳ තොරතුරු ඇතුලත් වාර්ථාවන් මින් ඉදිරියට නිසි පරිදි කොමිට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දී අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත .
08. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුල ක්‍රියාත්මක කර නොතිබුණි.	අ. මින් ඉදිරියට අදාළ නිර්දේශයන් නියමිත කාල වකවානුව තුල ක්‍රියාත්මක කරන ලෙස අදාළ අංශ වෙත උපදෙස් ලබා දී අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.
09. සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්ථා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අ. අදාළ වාර්ථා නිසි පරිදි ඉදිරියේදී විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

10. මූ.රෙ. 94 (1) ප්‍රකාරව විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇති කරගෙන තිබුණි.	අ. වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කටයුතු සිදුකරගෙන යාමේදී ඇතැම් අවස්ථාවල අධික වියදමක් වැයකර අත්කරගෙන ඇති නෞකා සහ යාත්‍රාවන් වල ක්ෂණික අළුත්වැඩියා කටයුතු සිදු කල යුතුම අවස්ථාවන් වලදී එම අළුත්වැඩියාවන් සිදු නොකිරීම හේතුවෙන් සිදුවිය හැකි විශාල අලාභහානි මගහරවා ගැනීමේ අරමුණින් මෙසේ බැඳීම් ඇති කර ගැනීමට සිදුවූ අතර, ඉදිරියේදී වෙන් කරන ලද සීමාව ඉක්මවා බැඳීම් ඇති කර නොගැනීමට හැකි උපරිම ලෙස කටයුතු කරනු ලැබේ.
11. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් කාර්යය සඳහා පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමා ඉක්මවීම් පිළිබඳ ආවරණ අනුමැතිය ලබාගෙන නොතිබුණි .	අ. වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කාර්යය මණ්ඩලය ශ්‍රී ලංකා නාවික හමුදාව වෙතින් ණය අත්තිකාරම් ලබා ගන්නා බැවින් මෙම දෙපාර්තමේන්තුව විසින් රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන යනු නොලැබේ.
12. හිහහිටි ණය ශේෂවල කාල විශ්ලේෂණයක් සකස් කර නොතිබුණි .	අ. වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කාර්යය මණ්ඩලය ශ්‍රී ලංකා නාවික හමුදාව වෙතින් ණය අත්තිකාරම් ලබාගන්නා බැවින් මෙම දෙපාර්තමේන්තුව විසින් රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන යනු නොලැබේ.
13. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	අ. වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කාර්යය මණ්ඩලය ශ්‍රී ලංකා නාවික හමුදාව වෙතින් ණය අත්තිකාරම් ලබා ගන්නා බැවින් මෙම දෙපාර්තමේන්තුව විසින් රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන යනු නොලැබේ. (එම නිසා මෙම නිරීක්ෂණය වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ නොවේ.)
14. අදාළ විධිවිධාන වලට අනුකූලව රැස්කළ ආදායම් ආපසු ගෙවා නොතිබුණි.	අ. වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව ආදායම් උපයනු ලබන ආයතනයක් නොවන බැවින්, ආදයම් රැස්කර තබාගැනීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.
15. රැස්කර තිබුණු ආදායම් නියමිත කාලය තුල නියමානුකූල ලෙස බැහැර කර නොතිබුණි.	අ. වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව ආදායම් උපයනු ලබන ආයතනයක් නොවන බැවින්, ආදයම් රැස්කර තබාගැනීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

16. අනුමත සීමාව ඉක්මවා කාර්යය මණ්ඩල බඳවා ගෙන තිබුණි .	අ. අනුමත කාර්යය මණ්ඩලය හය දෙනෙකු වන අතර, දැනට දෙදෙනෙකු පමණක් බඳවාගෙන ඇත. අනෙකුත් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක පුද්ගල අවශ්‍යතාව සම්පූර්ණ කරනු ලබන්නේ ද්විතීක පදනම මත ශ්‍රී ලංකා නාවික හමුදාව මඟින් වන අතර, නිලධාරීන් ඇතුලු නාවිකයන් 1600 ක් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කිරීමට රේඛීය අමාත්‍යාංශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇත. නමුත් වර්තමානයේ සිටින මුළු වෙරළ ආරක්ෂක පුද්ගලයන් සංඛ්‍යාව 1388 ක් පමණක් වේ.
17. 2017.09.20 දිනැති 2017 අංක 4 දරණ කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව කාර්යය මණ්ඩල තොරතුරු කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුලත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකර නොතිබුණි.	අ. අදාළ වාර්තා 2017 වර්ෂයේ දෙසැම්බර් සිට මේ දක්වා නොකඩවා කාර්තු වශයෙන් ශ්‍රී ලංකා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.
දෙවන කොටස :	
01. ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	අ. මේ සඳහා අවශ්‍ය කටයුතු සිදුවෙමින් පවතින අතර, අවශ්‍ය පහසුකම් www.coastguard.gov.lk හරහා ක්‍රියාත්මක කිරීමට නියමිතය.
02. ආයතනය තම විෂය පථය අනුව තිරසාර අරමුණු හඳුනාගෙන නොතිබුණි.	අ. ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු විෂය පථයට අනුව තිරසාර සංවර්ධන ඉලක්ක අංක **06, 11, 14, 15** සහ **16** යන තිරසාර අරමුණු හඳුනාගෙන ඇති අතර, ඉදිරියේදී ඊට අදාළ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට නියමිතය.
03. හඳුනාගත් තිරසාර අරමුණු ඉලක්ක ලඟාකර ගැනීම මැන බැලීම සඳහා කාර්යසාධන ඉලක්ක නියම කර නොතිබුණි.	අ. අදාළ තිරසර අරමුණු ඉලක්ක ඉදිරි කාලය තුළ නියම කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට නියමිතයි.

04. ආයතනයේ තිරසර අරමුණු ඉලක්ක ලඟාකර ගැනීමට අදාළ වන නිශ්චිත පාර්ශව හඳුනාගෙන නොතිබුණි.	අ. මේ වන විට අදාළ නිශ්චිත පාර්ශව හඳුනා ගෙන ඇත.
05. 2018 අප්‍රේල් 27 දිනැති අංක MSDW/08/65 දරණ චක්‍රලේඛ විධි විධාන අනුව ඉටු කළ යුතු තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පත්කල යුතු නියෝජිතයන් දෙදෙනා පිළිබඳව විස්තර අමාත්‍යාංශය වෙත වාර්ථාකර නොතිබුණි.	අ. අදාළ නියෝජිතයන්ගේ විස්තර කඩිනමින් ඉදිරිපත් කරනු ලැබේ.
06. පුරවැසි සේවා ලාභී /ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	අ. ඉදිරියේදී පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කරීමට සහ ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.
07. ආයතනයේ පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳව අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	අ. ඉදිරි කාලයේදී නිසි ක්‍රමවේදයක් සැකසීමට නියමිත වේ.
08. රාජ්‍ය පරිපාලන විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	අ. ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සඳහා දැනට මානව සම්පත් සැලැස්මක සටහන පිළියෙල කරමින් පවතී. තවද, මේ සඳහා යෝජිත වැඩපිළිවෙල ඉදිරිපත් කොට වැඩිදුර උපදෙස් සඳහා යොමුකර ඇත.
09. සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් එක් සේවකයෙක් සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12 ක අවම පුහුණුවක් නියම කර නොතිබුණි.	අ. වර්තමානයේ සෑම වෙරළ ආරක්ෂක පුද්ගලයෙකුටම පැය 12 ට වඩා වැඩි පුහුණුවක් වාර්ෂිකව ලබාදීමට ක්‍රියාකර ඇත.
10. සමස්ථ කාර්යය මණ්ඩලයට ඇතුළත්ව කාර්යසාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	අ. නුදුරේදීම ගිවිසුම් ගත වීමට පියවර ගනු ලැබේ.

11. මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	අ. මේ වන විට ඒ සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත් කොට ඇත.
12. සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	අ. ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ වාර්ෂික පුහුණු සැලසුම දේශීය හා විදේශීය ලෙස ඛාණ්ඩ 02 කට බෙදා ඇති අතර, 2018 වර්ෂයේ අපේක්ෂිත විදේශීය පුහුණු පාඨමාලාවන් ගණන 20 ක් විය. නමුත් 2018 වර්ෂයේ විදේශීය පුහුණු පාඨමාලාවන් 29 ක් ලැබී ඇත. එය අපේක්ෂිත ප්‍රමාණය ඉක්මවා යාමකි. දේශීය පුහුණු පාඨමාලා 60 ක් සැලසුම් කර තිබූ අතර, එයින් 44 ක් 2018 වර්ෂයේ සාර්ථකව නිම කොට ඇත. එමගින් 74%ක පුහුණු ප්‍රගතියක් ලඟාකර ගෙන ඇත.

දීපිකා බුද්ධදාස
ප්‍රධාන මූල්‍ය නිලධාරි - I
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ.

09. ශ්‍රී ලංකා පොලිසිය

කම්ටුව විසින් හඳුනාගනු ලැබූ දුර්වලතා	දුර්වලතාවයන් සමථයකට පත්කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග/වර්තමාන තත්ත්වය
පළමු කොටස :	
01. ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	අ. ශ්‍රී ලංකා පොලීසියට අයත් ස්ථාවර වත්කම් ලේඛනය මේ වන විට සකස්කර යාවත්කාලීනව පවත්වා ගැනීමට කටයුතු කර ඇත.
02. 2004.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ පළවෙනි මුරපදය ගණකාධිකාරී හෝ අවසරලත් මාණ්ඩලික නිලධාරියෙකු පමණක් භාවිතා කර නොතිබුණි.	අ. මේ පිළිබඳව කොට්ඨාශ භාර නිලධාරීන් සහ ගණකාධිකාරීවරුන් දැනුවත් කර ඇති අතර, ඉදිරියේ දී මෙම තත්ත්වය ඇති නොවීමට කටයුතු සිදුකර ඇත.
03. 2004.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ පළමු, දෙවන සහ තෙවන මුරපද තුන් මසකට වරක් වෙනස් කර නොතිබුණි.	අ. මේ පිළිබඳව කොට්ඨාශ භාර නිලධාරීන් සහ ගණකාධිකාරීවරුන් දැනුවත් කර ඇති අතර, ඉදිරියේ දී මෙම පරිගණක මෘදුකාංගයට අදාළ පළමු දෙවන සහ තෙවන මුරපද තුන් මසකට වරක් වෙනස් කිරීමට උපදෙස් ලබා දී ඇත.
04. විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	අ. ශ්‍රී ලංකා පොලීසියේ රාජකාරී ලිපි ලේඛන තනතුරු ධූරාවලි හරහා සංසරණය වීමට ගතවන කාලය අනුව විගණන විමසුම් සඳහා පිළිතුරු සකස් කිරීමේ අංශයට ලැබෙන විට යම් ප්‍රමාදයක් සිදුවන බව නිරීක්ෂණය වේ. ඊට අමතරව දීප ව්‍යාප්තව පැතිරුණු ශ්‍රී ලංකා පොලීසිය වැනි ආයතනයක් සම්බන්ධව ඉදිරිපත්වන විගණන විමසුම් සඳහා අදාළ අංශ වෙතින් තොරතුරු කැඳවීමට සහ ප්‍රගතිය පරීක්ෂා කිරීමට ද යම් කාලයක් ගතවේ. එබැවින් මෙම ප්‍රමාදය අවම කිරීම සඳහා

	විගණන විමසුමෙහි පිටපතක් සෘජුව ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත සහ අදාළ කොට්ඨාශ භාර නිලධාරී වෙත යොමුකර ගැනීමට විගණකාධිපති වෙතින් ඉල්ලීම් කර මෙම ලිපි සංසරණයේදී ඇතිවන ප්‍රමාදය අවම කර පිළිතුරු සැපයීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.
05. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	අ. දීප ව්‍යාප්තව ඇති පොලිස් ස්ථානවලට සහ උප ගිණුම් ඒකක වලට යැවෙන අභ්‍යන්තර විගණන විමසුම් විවිධ ක්ෂේත්‍ර වලට අදාළව යොමුවන බැවින්, එම විමසුම් වලට අදාළව තොරතුරු රැස් කිරීමේ දී සහ අදාළ අයකිරීම් සිදු කිරීමේ දී සැළකිය යුතු කාලයක් ගතවන බැවින් මෙලෙස මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කිරීමට නොහැකි වන බව පෙනෙන්නට තිබේ. නිලධාරීන් නිරන්තරයෙන් ස්ථාන මාරුවීම් සිදුවීම වැනි හේතු ද එයට බලපායි. කෙසේ වෙතත් අභ්‍යන්තර විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු ගෙන්වා ගැනීමට ගත හැකි සෑම පියවරක්ම ගැනීමට කටයුතු කරනු ලැබේ.
06. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාර 2018.08.01 දිනෙන් පසුව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අ. අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම මේ වන විට නිසි පරිදි සිදු කරනු ලැබේ.
07. 2016.03.31 දිනැති අංක 5/2016 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අ. ශ්‍රී ලංකා පොලීසියේ භාණ්ඩ සමීක්ෂණයට ලක්වන ස්ථාන 800 කට අධික ප්‍රමාණයක් පවතී. එබැවින් සෑම වර්ෂයකම ජුනි 15 දිනට පෙර ශ්‍රී ලංකා පොලීසියේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය අවසන් කිරීම ප්‍රායෝගිකව සිදුකළ නොහැකි තත්ත්වයට පත්ව ඇත. එසේවුවත් 2018 වර්ෂයේ ශ්‍රී ලංකා පොලීසියට අයත් සියළු ස්ථානවල භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.

8. බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මූ.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	අ. 2018.12.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශන වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ හඳුනාගෙන මේ වන විට නිරවුල් කර ඇත. එසේම බැංකු සැසඳුම් ප්‍රකාශ මඟින් අනාවරණය වන ගැලපුම් කළ යුතු ශේෂ මසක් තුල නිරවුල් කිරීම සඳහා කටයුතු කරමින් පවතී.
9. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	අ. 2018.12.31 දිනට හිඟ ණය ශේෂය රු. 88,696,931.65ක් වේ. එම ශේෂයෙන් 2019.12.31 දිනට රු. 8,963,897.88ක් නිරවුල් කිරීමට කටයුතු කර ඇත. 2018.12.31 දිනට හිඟ හිටි ණය ශේෂයෙන් තවදුරටත් නිරවුල් කළ යුතු ශේෂය රු.79,733,033.77ක් වේ. එම ඉතිරි ණය ශේෂයන්ද නිරවුල් කිරීම සඳහා ණය අයකර ගැනීමේ ප්‍රධාන ඒකකයක් යටතේ අනු ඒකක 52 පිහිටුවා, හිඟ ණය ශේෂ අයකර ගැනීමේ කටයුතු අඛණ්ඩව සිදුකරමින් පවතී. ආ. හිඟ ණය අය කර ගැනීමේ කටයුතු සම්බන්ධව අධීක්ෂණය හා සමාලෝචනය කිරීම සඳහා විෂයභාර අමාත්‍යාංශයේ නීතිය හා සාමය අංශයේ ප්‍රධාන ගණකාධිකාරී හා සහකාර ලේකම්වරයෙකු සාමාජිකත්වය දරණ කමිටුවක් මඟින් සෑම මාස 02 කට වරක් රැස් වී ප්‍රගතිය සමාලෝචනය කර අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.
10. පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මූ.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	අ. 2019.12.31 දිනට වසර 02 ඉක්මවූ තැන්පතු ශේෂය රු.228,114,632.85 කි. එම තැන්පතු වටිනාකමින් රු.7,961,685.51 ක් රජයේ ආදායමට බැර කිරීමට හෝ නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ. මෙම තැන්පතු වටිනාකමින් රු.202,223,781.62 ක් බෙරුම්කරණය ක්‍රියාවලියට අවතීර්ණ වී ඇති කොන්ත්‍රාත්වලට අදාළ තැන්පතු වේ.
11. අදාළ විධිවිධාන වලට අනුකූලව රැස්කළ ආදායම් ආපසු ගෙවා නොතිබුණි. රැස්කර තිබුණු ආදායම් නියමිත කාලය තුළ නියමානුකූල ලෙස බැහැර කර නොතිබුණි.	අ. මේ පිළිබඳව කොට්යාශ භාර නිලධාරීන් සහ ගණකාධිකාරීවරුන් දැනුවත් කර ඇති අතර, ඉදිරියේ දී මෙම තත්ත්වය ඇති නොවීමට කටයුතු සිදුකර ඇත.

12. සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු කාර්යසාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි.	අ. 2018 වර්ෂය සඳහා වූ වාර්ෂික කාර්යසාධන වාර්තාව 2019.06.19 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත. ශ්‍රී ලංකා පොලීසියට අනුයුක්තව දෙමළ භාෂා පරිවර්ථකයකු නොමැතිවීම හේතුවෙන් සුදුසුකම්ලත් බාහිර පරිවර්තකයකු ලවා සිදුකර ගන්නා ලදී. එබැවින් 2018 වාර්ෂික කාර්යසාධන වාර්තාව දෙමළ භාෂාවට පරිවර්තනයේදී සති තුනක පමණ ප්‍රමාදයක් ඇතිවී ඇත.
13. අනුමත සීමාව ඉක්මවා කාර්යය මණ්ඩල බඳවාගෙන තිබුණි.	අ. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/E/2/PD-01 (Vol 1) හා 2007.02.06 දිනැති ලිපියෙන් අනුමත කළ පොලිස් ආරක්ෂක සහායක සේවයේ තනතුරු 1789 න් තනතුරු 1731ක් යටපත් කර, ඒ වෙනුවට ශ්‍රී ලංකා පොලීසියේ නිත්‍ය සේවයට පොලිස් කොස්තාපල් තනතුරු 1731ක්, මු.රෙ.71 යටතේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇත. ආ. මේ වන විට සිවිල් කාර්යය මණ්ඩලයට අයත් අනියම් තාවකාලික කම්කරුවන් 13 දෙනෙක් පමණක් රාජකාරි කරමින් පවතින අතර, ඔවුන්ගේ ලිපිගොනුවල පවතින විවිධ ගැටළු හේතුවෙන් ඔවුන් වෙත විධිමත් පත්වීම් ලිපි නිකුත් කිරීමට ප්‍රමාද වී ඇත. ඉදිරියේ දී ඔවුන් 13 දෙනාද ස්ථිර වීමෙන් පසු ශ්‍රී ලංකා පොලීසිය තුළ අනියම් පදනමින් සිටින කිසිවකුත් නොමැත.
14. 2017.09.20 දිනැති 2017 අංක 4 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව කාර්යය මණ්ඩල තොරතුරු, කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකර නොතිබුණි.	අ. ශ්‍රී ලංකා පොලීසියට අදාළ කාර්යය මණ්ඩල වාර්තාව සෑම කාර්තුවක් අවසානයේදීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලබන අතර, අදාළ වාර්තාව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත විද්‍යුත් තැපෑල මඟින් ද යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. ඒ අනුව අවසාන වරට 2020.04.22 දින නිල ඇඳුම් කාර්යය මණ්ඩල වාර්තාව යොමු කර ඇති අතර, 2020.06.30 දිනට අදාළ සිවිල් කාර්යය මණ්ඩල වාර්තාව ද මේ වන විට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.

දෙවන කොටස :	
01. පුරවැසි / සේවා ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	ඇ. පුරවැසි / සේවා ප්‍රඥප්තිය පිළියෙල කර ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම සිදු කරමින් පවතී. සමස්ථ කාර්යය මණ්ඩලයට ඇතුලත්ව කාර්යසාධන ගිවිසුම් සකස් කිරීමට උපදෙස් ලබා දී ඇත.
02. ආයතනයේ පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	
03. සමස්ථ කාර්යය මණ්ඩලය ඇතුළත්ව කාර්යසාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි.	
04. විගණකාධිපතිවරයා විසින් ඡේදවලින් පෙන්වා දී තිබූ අඩුපාඩු / දෝෂ නිවැරදි කරවාගෙන නොතිබුණි.	ඇ. විගණකාධිපතිවරයා විසින් ඡේදවලින් පෙන්වා දෙන අඩුපාඩු / දෝෂ නිවැරදි කර ගැනීමට කටයුතු කරමින් පවතී.

දීපිකා බුද්ධදාස
ප්‍රධාන මූල්‍ය නිලධාරි - I
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ.

10. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

කම්ටුව විසින් හඳුනාගනු ලැබූ දුර්වලතා	දුර්වලතාවයන් සමථයකට පත්කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග/වර්තමාන තත්ත්වය
පළමු කොටස :	
01. 2004.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් වක්‍රලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ පළවෙනි මුරපදය ගණකාධිකාරී හෝ අවසරලත් මාණ්ඩලික නිලධාරියෙකු පමණක් භාවිතා කර නොතිබුණි.	අ. මේ වන විට රාජ්‍ය ගිණුම් වක්‍රලේඛ ප්‍රකාරව වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ පළවෙනි මුරපදය ගණකාධිකාරීට පමණක් භාවිතා කිරීමට හැකිවන පරිදි අවශ්‍ය පියවර ගෙන කටයුතු කරගෙන යනු ලැබේ.
02. 2004.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් වක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ පළමු, දෙවන සහ තෙවන මුරපද තුන් මසකට වරක් වෙනස් කර නොතිබුණි.	අ. වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ පළමු, දෙවන සහ තෙවන මුරපද තුන් මසකට වරක් වෙනස් කරමින් පවත්වාගෙන යාම සිදු කරයි.
03. විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	අ. මේ වන විට විගණන විමසුම් සඳහා මසක් ඇතුළත පිළිතුරු ලබා දීමට සෑම විටම කටයුතු කරන ලෙස අවශ්‍ය උපදෙස් ලබා දී තිබෙන අතර, ඒ අනුව කටයුතු කරමින් පවතී.
04. සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අ. විගණිත දිනය වන විට ඉදිරිපත් වී නොතිබුණ නමුත්, 2018 වර්ෂයට අදාළව මෙම වාර්තා පසුව විගණකාධිපති වෙත යොමුකර ඇති අතර, වර්තමානයේදී නියමිත පරිදි අදාළ වාර්තා විගණකාධිපති වෙත යොමු කිරීමට අවශ්‍ය පියවර ගෙන තිබේ.
05. මු.රෙ. 94 (1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු	අ. මු.රෙ. 94 (1) ප්‍රකාරව බැඳීම් ඇතිකර ගැනීමේදී අනුමත ප්‍රතිපාදන සීමාව නොඉක්මවා බැඳීම් ඇති කර ගැනීමත්, ඒ පිළිබඳ

ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇතිකර ගෙන තිබුණි.	නිරන්තර අවධානයෙන් කටයුතු කිරීමටත් අවශ්‍ය පියවර ගෙන තිබේ.
06. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	අ. අයවීමට ඇති ණය ශේෂයන්ගෙන් වැඩි ප්‍රතිශතයක් මේ වන විට නිරවුල් කර ඇත. ඉතිරි ණය ශේෂ අයකර ගැනීමට අවශ්‍ය නීතිමය හා අනෙකුත් ක්‍රියාමාර්ග ගනිමින් පවති.
07. මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්යය අතුරු අග්‍රිම කාර්යය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	අ. මු.රෙ. 371 ප්‍රකාරව කටයුතු කිරීමට මේ වන විට පියවර ගෙන තිබේ. ඒ පිළිබඳ නියමානුකූලව කටයුතු කරන ලෙසද අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී තිබේ.
දෙවන කොටස :	
01. 2018 අප්‍රේල් 27 දිනැති අංක MSDW/08/65 දරණ චක්‍රලේඛ විධි විධාන අනුව ඉටු කළ යුතු තිරසාර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පත්කළ නියෝජිතයන් දෙදෙනා පිළිබඳව විස්තර අමාත්‍යාංශය වාර්තා කර නොතිබුණි.	අ. 2018 අප්‍රේල් 27 දිනැති අංක MSDW/08/65 දරණ චක්‍රලේඛය අනුව තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා නියෝජිතයන් දෙදෙනෙකු මේ වනවිට පත්කර තිබේ.
02. රාජ්‍ය පරිපාලන විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	අ. 2018 වර්ෂය සඳහා මානව සම්පත් සැලැස්ම පිළියෙල කර නොතිබූ නමුත්, 2018.01.24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් "ඇමුණුම 02" ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්ම මේ වන විට පිළියෙල කර තිබේ.
03. සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් එක් සේවකයෙකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12 ක අවම පුහුණුවක් නියම කර නොතිබුණි.	අ. විගණික දිනය වන විට සකස් කර නොතිබූ නමුත් වර්තමානයේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 හි විධි විධාන පරිදි පුහුණු සැලැස්ම සකස් කර ඒ අනුව, සෑම සේවකයෙකු සඳහාම අවම වශයෙන් වර්ෂයකට පැය 12 ක පුහුණුවක් ලබාදීමට කටයුතු කරමින් පවතී. මේ සම්බන්ධයෙන් අවශ්‍ය ඉදිරි කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් ලබාදී ඇත.

04. සමස්ත කාර්යය මණ්ඩලයට ඇතුළත්ව කාර්යසාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	අ. සමස්ත කාර්යය මණ්ඩලයට ඇතුළත්ව කාර්යසාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගත කිරීමට කටයුතු සිදු කරගෙන යනු ලැබේ.
05. සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	අ. 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය 61% වේ. වර්තමානය වන විට පුහුණු සැලැස්ම නිසි ලෙස සකස් කර සාර්ථක ප්‍රගතියක් අත්කර ගනිමින් පවතී. ඒ අනුව 2019 වර්ෂයේදී අදාල අගය 99.67% ප්‍රතිශතයක පැවතී ඇත.
06. විගණකාධිපතිවරයා විසින් ඡේදවලින් පෙන්වා දී තිබූ අඩුපාඩු / දෝෂ නිවැරදි කරවාගෙන නොතිබුණි.	අ. විගණකාධිපති විසින් ඡේදවලින් පෙන්වා දී ඇති බොහෝ අඩුපාඩු නිවැරදි කර ඇති අතර, ඉතිරි අඩුපාඩු කඩිනමින් නිවැරදි කර ගැනීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී.

දීපිකා බුද්ධදාස
ප්‍රධාන මූල්‍ය නිලධාරි - I
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ.

11. කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

කම්ටුව විසින් හඳුනාගනු ලැබූ දුර්වලතා	දුර්වලතාවයන් සමථයකට පත්කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග/වර්තමාන තත්ත්වය
පළමු කොටස :	
01. ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	අ. දැනට පවතින ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.
02. විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	අ. බොහෝ විගණන විමසුම් සඳහා මසක් ඇතුළත පිළිතුරු යවා ඇත. කරුණු රැස්කර පිළිතුරු සකස් කල යුතු විගණන විමසුම් සඳහා මාසයකට වැඩි කාලයක් ගත වී ඇත. එසේම දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැර වූ යම් යම් ප්‍රායෝගික ගැටලු ද ප්‍රමාද වීම සඳහා බලපා ඇත.
03. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	අ. 2018 වර්ෂයේ අභ්‍යන්තර විගණකවරයෙක් මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී නොසිටින ලදී.
04. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාර 2018.08.01 දිනෙන් පසුව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අ. වර්තමානයේ අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.
05. මු.රෙ.134(2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අ. 2019 වර්ෂයේ සිට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබේ.
06. විගණන හා කළමනාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර 02 ක් වත් පවත්වා නොතිබුණි.	අ. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් එවකට පැවති ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මඟින් පවත්වනු ලැබූ අතර, ඒ සඳහා කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නිලධාරීන් සහභාගී වී ඇත.

07. 2017.06.26 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොමිට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අ. අපහරණ භාණ්ඩ ලැයිස්තුව සකස් කරගැනීමේ ප්‍රමාද වීම හේතුවෙන් භාණ්ඩ අපහරණ කටයුතු සිදුකර නොමැත. ඉදිරියේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු නියමිත පරිදි කොමිට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.
08. 2017.06.26 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියෙකු පත්කර කොමිට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත දන්වා නොතිබුණි.	අ. අංක EB/CC/NFA/2017 දරණ 2017.07.27 දිනැති ලිපිය මඟින් සම්බන්ධීකරණ නිලධාරියෙකු පත්කර කොමිට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත දැනුම් දී ඇත.
09. 2016.03.31 දිනැති අංක 5/2016 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අ. 2019 මාර්තු 29 දින භාණ්ඩ සමීක්ෂණ වාර්තා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ විගණන උප කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත.
10. සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අ. 2019 වර්ෂයේ සිට අදාළ වාර්තා කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ විගණන උප කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත.
11. 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව ආයතනය සතු වාහන වල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	අ. 2020 වර්ෂය තුළ ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් සිදුකිරීමට නියමිතය.
12. පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන්	අ. 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය අනුව මු.රෙ. 571 යටතේ ක්‍රියාකල නොමැති බව සඳහන් රු. 289,834.00

මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	තැන්පත් මුදලින් රු. 39,899.14 මුදලක් මෙවන විට නිරවුල් කර ඇති අතර, රු. 70,000.00 ක් නිලධාරීන්ගේ ඇප තැන්පත් මුදල් වේ. ගිවිසුම් කාලය අවසන් වනතුරු එම මුදල් නිරවුල් කල නොහැකිය. ඉතිරි මුදල් පිළිබඳව මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කරමින් පවතී. ඉතිරි මුදල් රජයේ ආදායමට බැර කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කර ඇති අතර, අනුමැතිය ලැබුණු පසු නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.
13. 2017.09.20 දිනැති 2017 අංක 4 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව කාර්යය මණ්ඩල තොරතුරු කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොතිබුණි.	අ. වර්තමානයේදී අදාළ තොරතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත නියමිත පරිදි යොමු කරනු ලැබේ.
දෙවැනි කොටස :	
01. මහජනයා විසින් ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබාදීම / ලබා නොදීම සම්බන්ධ විස්තර ඇතුළත් ලේඛණයක් පවත්වා නොතිබුණි.	අ. 2019 වර්ෂයේ සිට තොරතුරු ලබාදීම සම්බන්ධ විස්තර ඇතුළත් ලේඛණයක් පවත්වාගෙන යනු ලැබේ. තොරතුරු ලබා නොදීම් මෙතෙක් සිදුවී නොමැති බැවින්, ඒ සම්බන්ධ විස්තර ඇතුලත් ලේඛණයක් නොමැත.
02. ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛණගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛණ පවත්වා නොතිබුණි.	අ. තොරතුරු ලබා නොදීම් මෙතෙක් සිදුවී නොමැති බැවින් පැමිණිලි ඉදිරිපත් වී නොමැත. එහෙත් ඉදිරියේදී අදාළ පැමිණිලි ලැබුණු විට ලේඛණගත කිරීම් සිදුකිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.
03. 2018.අප්‍රේල් 27 දිනැති අංක MSDW/08/65 දරණ චක්‍රලේඛ විධි විධාන අනුව ඉටුකල යුතු තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පත්කල යුතු නියෝජිතයන් දෙදෙනා පිළිබඳව විස්තර	අ. නියෝජිතයන් දෙදෙනා පිළිබඳව විස්තර අමාත්‍යාංශය වෙත වාර්තා කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.

අමාත්‍යාංශය වෙත වාර්තා කර නොතිබුණි.	
04. පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	අ. මෙම දෙපාර්තමේන්තුවට අදාළව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සකස් කර අනුමැතිය සඳහා එවකට අදාළව පැවැති ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.
05. ආයතනයේ පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	අ. ක්‍රමවේදයක් සකස් කරමින් පවතී.
06. රාජ්‍ය පරිපාලන විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	අ. මානව සම්පත් සැලැස්ම 2020 වර්ෂයේදී පිළියෙළ කිරීමට කටයුතු කරනු ලැබේ.
07. සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් එක් සේවකයෙකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12 ක අවම පුහුණුවක් නියම කර නොතිබුණි.	අ. 2019 වර්ෂයේදී බොහෝ නිලධාරීන් සඳහා පැය 12 ක අවම පුහුණුවක් හෝ ලබා දී ඇත. පවතින ප්‍රතිපාදන ප්‍රමාණයක් මත යම් නිලධාරීන් පිරිසකට පැය 12 ට අඩු පුහුණුවීම් ලැබුණු නමුත් දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් සඳහා 2020 වර්ෂයේ සිට පුහුණුවීම් අවස්ථා ලබාදීමට අවශ්‍ය පියවර ගෙන ඇත.
08. සමස්ථ කාර්යය මණ්ඩලයට ඇතුළත්ව කාර්යසාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි.	අ. 2020 වර්ෂයේදී මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට නියමිතය.
09. සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	අ. කාළගුණ විද්‍යා නිලධාරීන් වෙනුවෙන් පවත්වනු ලබන CET පුහුණු වැඩසටහනෙහි එක් නිලධාරි කණ්ඩායමක් සඳහා මධ්‍යස්ථානයක් සොයා ගැනීමට අපහසු වීම හේතුවෙන් සැලසුම්ගත පුහුණු වීම් පැවැත්වීමට නොහැකි විය. එය 2019 වර්ෂයේ මුල් කාර්තුවේදී පැවැත්විය.

10. අයවැය චක්‍රලේඛය අනුව අවම වශයෙන් නිමවුම් දර්ශක තුනක් හඳුනාගෙන ලේඛණ ගත කර නොතිබුණි.	
11. ආයතනය විසින් ඉටුකරනු ලබන කාර්යභාරය හා සම්බන්ධිතව ප්‍රධාන කාර්ය දර්ශක 03 ක් හඳුනාගෙන නොතිබුණි.	
12. හඳුනාගත් පළමු කාර්යසාධන දර්ශකයේ ළඟාවීම 50% ට වඩා අඩු ප්‍රමාණයෙන් විය.	අ. මෙම නිරීක්ෂණ කඩිනමින් සමථයකට පත් කිරීමට කටයුතු කරනු ලැබේ.
13. හඳුනාගත් දෙවන කාර්යසාධන දර්ශකයේ ළඟාවීම 50% වඩා අඩු මට්ටමක විය.	
14. හඳුනාගත් තුන්වන කාර්යසාධන දර්ශකයේ ළඟාවීම 50% වඩා අඩු මට්ටමක විය.	

දීපිකා බුද්ධදාස
ප්‍රධාන මූල්‍ය නිලධාරි - I
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ.